# ආගමික නිදහස හා නීතිය

බටහිරයන් මෙරටට පැමිණීමට පෙර මෙහි බුද්ධාගමක් යනුවෙන් ජීවිතයෙන් වෙන්කරන ලද ආගමක් නො වී ය. බුද්ධාගම, ආගමක් වූයේ බටහිර නූතනත්වය අප මත පැටවීමෙන් පසුව ය. මේ ලිපිය කියවන ඇතැමුන් වැරදි නිගමනවලට පැමිණීමට ඉඩ ඇති බැවින් මෙය තවදුරටත් පැහැදිලි කළ යුතු ය. බටහිර නූතනත්වයේ එක් ප්‍රධාන ලක්‍ෂණයක් වූයේ වෙන්කිරීම ය. කලාව, විද්‍යාව ආදී වශයෙන් දැනුම කොටස්වලට කැඩුණේ පහළොස්වැනි සියවසේ බටහිර නූතනත්වයෙන් පසුව ය. ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වූ මේ කැඩීම හේතුවෙන් අද වන විට ඒ ඒ විෂයන් ද කුඩා කොටස්වලට කැඩී ඇත. පෙරදිග රටවල ජනතාව මත සංස්කෘතික යටත්විජිතවාදයේ අංගයක් ලෙස බටහිර නූතනත්වය බලයෙන් පැටවීමට පෙර ලංකාව, භාරතය, චීනය වැනි රටවල තිබුණේ සමස්ත ජීවන ක්‍රමයකි. චීනය කොන්ෆියුෂියස්, ටාඕ, බෞද්ධ අදහස් රැගත් සංස්කෘතියකින් පෝෂණය විණි. ලංකාවේ තිබුණේ සිංහල බෞද්ධ සංස්කෘතියකි.

භාරතයේ ජීවන ක්‍රමය පශ්චාත් වෛදික සංස්කෘතියක් වටා ගෙතී තිබුණි. පශ්චාත් වෛදික සංස්කෘතියෙහි වෛදික මෙන් ම බෞද්ධ ජෛන අදහස් ද තිබුණි. බලි බිලි යාග හෝමවල දී සතුන් මැරූ වෛදිකයන් ඉන් ගලවා ගනු ලැබුයේ බෞද්ධ හා ජෛන අදහස් මගිනි. භාරතයෙහි හින්දු යනුවෙන් සංස්කෘතියක් හෝ නොතිබුණි. භාරතයේ විසූ ජනතාවට හින්දු යන්න ව්‍යවහාර කිරීමට පටන්ගත්තේ එහි පැමිණි මුස්ලිමුන් විසිනි. හින්දු යන්න ඉන්දු ගඟ ඇසුරෙන් නිර්මාණය කරගත්තක් විය. වෛදික අදහස්වලට බෞද්ධ අදහස් මිශ්‍රකිරීම දාර්ශනික වශයෙන් ගත්කල ක්‍රිස්තු වර්ෂ හතරවැනි සියවසින් පමණ පසුව සිදුවිය. සංකාරාචාර්යෝ මහායාන ශූන්‍යතාව කණපිට හරවා නිර්ගුණ බ්‍රහ්මන් සංකල්පය නිර්මාණය කළහ. පශ්චාත් වෛදික සංස්කෘතියෙන් හින්දු ආගම යනුවෙන් කොටසක් වෙන්කර ආගමක් ලෙස නම් කෙරුණේ ඉංගිරිසින් විසින් ය. ඉන් පෙර භාරතයෙහි වූයේ ජීවන ක්‍රමයක් ය. සිදුහත් කුමරු හින්දු භක්තියකු ලෙස ඉපිද හින්දු භක්තිකයකු ලෙස ජීවත්වී හින්දු භක්තිකයකු ලෙස මියගිය බවට සර්වපල්ලි රාධක්‍රිෂ්ණන් මහතා ඇතුළු ඉන්දියානුවන් දක්වන මතය මුළුමනින් ම වැරදි ය. පළමුවෙන් ම එදා හින්දු යනුවෙන් ආගමක් නො වී ය. දෙවනුව බටහිරයන් අපේ රටවලට පැමිණෙන විට භාරතයේ තිබූ පශ්චාත් වෛදික (හින්දු ලෙස අරාබින් විසින් හඳුන්වනු ලැබූ) සංස්කෘතිය ක්‍රිස්තු වර්ෂ හතරවැනි සියවසෙන් පමණ පසුව ඇතිවූ සංස්කෘතියකි. ඉහත සඳහන් කර ඇති අන්දමට එහි බෞද්ධ හා හින්දු අදහස් ද මිශ්‍ර වී තිබුණි. පශ්චාත් වෛදික සංස්කෘතියෙන් හින්දු යනුවෙන් ආගමක් වෙන්කරනු ලැබුයේ  ඉංගිරිසින් විසින් ය. සිදුහත් කුමරු උපත ලැබුයේ නැගෙනහිර භාරතයේ අර්ධ වෛදික සමාජයක ය. එය කිසිසේත්ම හින්දු නොවූවා පමණක් නොව පූර්ණ වෛදිකවත් නො වී ය. රාධක්‍රිෂ්ණන් මහතා ඇතුළු ඉන්දීය උගතුන්ට වුව ද බටහිර ආභාසයෙන් ගැලවීමට නොහැකිවිය.

සිංහල බෞද්ධ සංස්කෘතිය ජීවන ක්‍රමයක් විය. ඒ ජීවන ක්‍රමයෙහි බෞද්ධ අදහස් මෙන් ම පැරණි යක්‍ෂ, නාග, දේව ආදී හෙළ අදහස් ද විය. මිහිඳු මහ රහතන් වහන්සේ වැඩම කිරීමට පෙර මෙරට බෞද්ධ අදහස් නොතිබුණා නො වෙයි. තපස්සු භල්ලුක වෙළෙඳ දෙබෑයන් මෙරට චෛත්‍යයක් ද කළ බව සඳහන් වෙයි. ශාක්‍ය වාංශිකයකු වූ භද්දකච්චනා කුමරිය මෙරටට පැමින ඇත්තේ පරිබ්‍රාජිකාවගේ වේශයෙනි. එකල පරිබ්‍රාජකයන් පමණක් නොව පරිබ්‍රාජිකාවන් ද සිටි බව රාජ්‍ය නොවන සංවිධානවල මුදලින් යැපෙන අනුකාරක කාන්තා විමුක්ති නෝනලා (ලිබීලා) සිතට ගත යුතු ය. (අනුකාරකයන්ට මොන විමුක්තියක් ද?) පරිබ්‍රාජකයන් මෙන් ම පරිබ්‍රාජිකාවෝ ද විමුක්තිය (ලිබීලාගේ විමුක්තිය නොවුණ ද)  සොයා ගියහ. මිහිඳු මහ රහතන් වහන්සේ මෙරට  බුද්ධ ශාසනය පිහිටවූහ.

සන්ධාන ආණ්ඩුව ආගම්වලට හරවා ගැනීම වැළැක්වීම සඳහා පණතක් ඉදිරිපත් කිරීමට යයි. ඇතැම් අනුකාරකයන්ට අනුව මේ පණත සම්මත වුවහොත් මිහිඳු හාමුදුරුවන්ට ද දඬ ගැසිය යුතු ය. ඒ දේවානම් පියතිස්ස රජු හා එකල විසූ සිංහලයන් (එකල මෙරට දෙමළ යනුවෙන් ජනවර්ගයක් නොමැති විය. අද මෙරට සිටින දෙමළ ජනවර්ගය ලංකාවට ගෙන එනු ලැබුයේ ලන්දේසීන් හා ඉංගිරිසින් විසින් ය.) බුද්ධාගමට හැරවීම නිසා ය. මේ තකතීරු අනුකාරකයන්ට බටහිරයන් කියන දේ පුනරුච්චාරණය කිරීම සඳහා උගත්කමක් ඇතිමුත් කල්පනාකිරීමේ හැකියාවක් නොමැත. කල්පනාකිරීමේ හැකියාව පාසලේ දී හා විශ්ව විද්‍යාලයේ දී බටහිර අධ්‍යාපනය විසින් නැති කෙරෙයි. මිහිඳු හාමුදුරුවන් මෙරටට ගෙනා බුද්ධාගමක් නැත. බුද්ධාගමක් ගේන්නේ නැතිව මිනිසුන් බුද්ධාගමට හැරවිය හැකි නො වෙයි. මෙරටට

© Prof. Nalin De Silva

බුද්ධාගම ගෙනෙනු ලැබුයේ අප මත නූතනත්වය පැටවූ බටහිරයන් විසිනි. විශේෂයෙන් ම ඉංගිරිසින් විසිනි. අප බුද්ධාගමට “හරවනු” ලැබුයේ බටහිරයන් විසින් බැවින් දඬගැසිය යුත්තේ ඔවුන්ට ය. මෙහි දී විශේෂ කාර්‍යභාරයක් කළ ඕල්කට්තුමා ද අමතක නොකළ යුතු ය. සිංහල බෞද්ධයන් බුද්ධාගම්කාරයන් කිරීමේ කාර්‍යයට දායක වූ එතුමාට ද දඬයක් නියමකිරීමේ වරදක් නැත.

මිහිඳු හිමියන් පිහිටුවූයේ සිංහල බෞද්ධ ශාසනය ය. උන්වහන්සේ අපට ධර්මය දේශනා කළහ. අශෝක රජු මිනිසුන් බුද්ධාගමට හරවා ගැනීම සඳහා ධර්මදූත කණ්ඩායම් පිටත් නො කෙළේ ය. නැති ආගමකට මිනිසුන් හරවා ගන්නේ කෙලෙසෙ ද? ධර්මදූත යන සංකල්පය ඉංගිරිසි ඉවැන්ජලිස්ට් යන සංකල්පයට වඩා වෙනස් ය. ඉවැන්ජලිස්ට් යන්නෙහි ක්‍රිස්තියානි ආගමට හරවන්නා යන අර්ථය ද වෙයි. මෙය බටහිරයන් යුදෙව් සංස්කෘතියෙන් ලබාගත් සංකල්පයකි. යුදෙව්වෝ ලොවේ සියල්ලන් තමන්ගේ දෙවියන් වහන්සේ වෙතට හරවාගැනීමට ක්‍රියාකළහ. ඔවුන්ට එය නොකළ හැකි වුව ද නූතනත්වයේ ඇංග්ලො සැක්සන් ක්‍රිස්තියානිහු එය සාර්ථක ව ඉදිරියට ගෙන යති. ආගමකට හරවාගැනීමට පළමුවෙන් ආගමක් තිබිය යුතු ය. දෙවනුව අනෙකා මත තම ආධිපත්‍යය පැතිරවීමේ අවශ්‍යතාව තිබිය යුතු ය. බුදුන් වහන්සේ දෙසූ දහමෙහි ඒ දෙක ම නැත. ඒ බව මනාව පැහැදිලි වන අවස්ථාවක් නම් උපාලි ගෘහපති හා සම්බන්ධ සිද්ධිය ය.  සිංහල බෞද්ධ ශාසනයෙහි පැරණි හෙළයන්ගේ සංස්කෘතිකාංග ද වෙයි.

ක්‍රිස්තියානි ආගම ඇදහීම (ප්‍රැක්ටිස්) යන්නෙහි අන්‍යයන් ආගමට හැරවීම යන අදහස ද වෙයි. ක්‍රිස්තියානි ආගමික නිදහස යනු ක්‍රිස්තියානි ආගමට අනෙක් අය හැරවීමට ද ඇති නිදහස ය. ආගමික නිදහස යන සංකල්පය ම බටහිරයන් නිර්මාණය කර ගත් එකකි. ආගමික නිදහස යන සංකල්පය තිබීමට ආගමක් තිබිය යුතු බව පැහැදිලි ය. බටහිර නූතනත්වයේ සංකල්පයක් වන ආගමික නිදහස යන්න විශ්ලේෂණය කිරීමේ දී (එක්ස් කණ්ඩායමේ කසිකබල් පශ්චාත්නූතනවාදියකුට අවශ්‍ය නම් නොදැනුවත්කම නිසා හෝ විසංයෝජනය යන වචනය යොදාගත හැකි ය. පශ්චාත්නූතනවාදය යනු ජංගියක් දැයි මොවුන් අසා තිබුණි. නැත, පශ්චාත්නූතනවාදය යනු අධෝවාතයක් පමණකි. එහි ඇත්තේ ශබ්දයක් හා දුර්ගන්ධයක් පමණකි.) පෙනී යන කරුණ නම් ඒ සංකල්පය ඔවුන්ගේ වාසියට හා ආසියාතික හා අප්‍රිකානු සංස්කෘතීන් නැතිකිරීමට යොදා ගන්නා එකක් බව ය.

ආසියාවේ බෞද්ධ, හින්දු, චීන ආදී සංස්කෘතීන්හි ආගම යන සංකල්පය නැත. අදාළ රටවල වැසියන්ට ආගමක් ලැබුණේ බටහිරයන්ගෙන් ය. බටහිරයන්ගෙන් එසේ ලැබුණු ආගම්වල ඒ ආගම්වලට අනෙක් මිනිසුන් හරවාගැනීමේ සංකල්පය නැත. එවිට ආගමික නිදහස යන සංකල්පය යටතේ අන්‍යයන් තම ආගමට හරවාගැනීමේ අයිතිය ඇත්තේ ක්‍රිස්තියානින්ට පමණක් ය. විවිධ ක්‍රිස්තියානි නිකාය අද තරක කරන්නේ මෙරට ආගමික නිදහස තිබිය යුතු බවත්, ඒ හේතුවෙන් ක්‍රිස්තියානීන්ට ආගම ඇදහීමට, භාවිතයට (ප්‍රැක්ටිස් කිරීමට) නිදහස තිබිය යුතු බවත්, ආගම භාවිතය යන්න නිර්වචනය වන්නේ ඒ ඒ ආගම අනුව බවත්, ක්‍රිස්තියානියේ ආගම භාවිතය අනුව අන්‍යයන් ක්‍රිස්තියානියට හැරවීම ද එහි අංගයක් බවත්, එබැවින් ක්‍රිස්තියානීන්ට අන්‍යයන් ක්‍රිස්තියානි ආගමට හැරවීමේ අයිතිය ඇති බවත් ය. සුද්දාගේ නීතිය ඇත්තේ අවසානයේ දී සුද්දාට වාසිදායකවන ආකාරයට මිස අනෙක් අයට වාසිදායකවන අයුරින් නොවන බව මෙයට ඉහත දී ද පෙන්වා දී ඇත.

අප දැනට භාවිතා (ප්‍රැක්ටිස් - වෛද්‍යවරුන් නීතිඥයන් වැනි වෘත්තියකයන් තම වෘත්තියේ යෙදීමට කියන්නේ ද ප්‍රැක්ටිස් කරනවා කියා ය. එය ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ම නිර්මාණය කරගන්නා ලද අදහසකි. ඒ ඒ වෘත්තීන් මෙන් ම බුද්ධාගම ද ප්‍රැක්ටිස් කරන ඕල්කට් බෞද්ධයන්ට දෙවියන්ගේ ම පිහිට ය.) කරන්නේ රෝම ලන්දේසි නීතිය බැවින් අපට මේ ප්‍රශ්නවලට දැනට පිළිතුරු සොයාගැනීමට සිදුවී ඇත්තේ ද ඒ නීතිය හා එයට පදනම් වූ ඇරිස්ටෝටලීය න්‍යාය (ලොජික්) ඔස්සේ ය. අපට කීමට ඇත්තේ ආගමකට හැරවීමට ඔබට අයිතියක් ඇත්නම් ආගමකට නොහැරී සිටීමට මට ද පුද්ගලික අයිතියක් ඇත යන ආකාරයේ අදහසකි. ආණ්ඩුව ඉදිරිපත්කරන පණතෙහි බටහිරයන් විසින් ඕල්කට්තුමාගේ අනගි සහාය ද ඇතිව ඇතිකරන ලද ඕල්කට් බෞද්ධයන්ගේ හා වෙනත් අයගේ ඊනියා පුද්ගලික අයිතිය ද රැකෙන ආකාරයේ වගන්ති කිහිපයක් ද තිබිය යුතු ය. එහෙත් මේ සියල්ල හොරගල් ඇල්ලීම් පමණකි. අප උත්සාහ කළ යුත්තේ සුද්දාගේ නීතිය හරහා නිදහස්වීමට නොව සුද්දාගේ නීතියෙන් නිදහස් වීමට ය ~

© Prof. Nalin De Silva